# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1965/37 - 2016 මැයි මස 06 වැනි සිකුරාදා - 2016.05.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

155එ. වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. වැනි ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව,

1. මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති, පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි උප ලේඛනයේ II තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති එම නිලධරයන්ගේ පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම පිළිබඳ එකී කොමිෂන් සභාව සතු බලතල මෙම උපලේඛනයේ III තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති පොලිස්පතිවරයාට සහ අනෙකුත් පොලිස් නිලධරයන් වෙත 155එ. වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

එසේ වුවද, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් බලතල පැවරීමක් සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදු කරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ කිසියම් ප්‍රශ්නයක් උද්ගතවන අවස්ථාවක දී ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

තවද එසේ වුවද III තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති පොලිස් නිලධරයන් I තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති පොලිස් නිලධාරියෙකුට එරෙහිව යම් විනය පරීක්ෂණයකදී පැමිණිලිකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකු හෝ විභව්‍ය සාක්ෂිකරුවෙකු හෝ වන්නේ නම්, ජාතික පොලිස් කොමිෂන් සභාව, තමන් විසින් සිදු කරනු ලැබ තිබිය හැකි බලතල පැවරීම් කිසිවක් නොසලකා, මෙහි උපලේඛනයේ II තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති පරිදි පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහ කිරීමේ බලය, ඒ සම්බන්ධයෙන් කිසිදු බලතල පැවරීමක් සිදු කර නොමැති සේ සලකා නොකඩවා ක්‍රියාත්මක කළයුතු වන්නේය.

2. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට සහ අනෙකුත් පොලිස් නිලධාරීන් වෙත මෙයින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීමේදී පොලිස්පතිවරයා සහ අනෙකුත් පොලිස් නිලධාරීන් විසින් සෑම අවස්ථාවකදීම ගනු ලබන තීරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. වැනි ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් නිලධාරින්ගේ පත්කිරීම් උසස් කිරීම් සහ මාරුකිරීම් සම්බන්ධයෙන් පනවනු ලබන පරිපාටිමය රීතිවලට මෙන්ම එකී කොමිෂම කාලයෙන් කාලයට තීරණය කරන රීති, රෙගුලාසි සහ අනෙකුත් විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවට එකී ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතවම නියම කරනු ලැබේ.

එසේ වුවද (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. ව්‍යවස්ථාව ප්‍රකාරව) පොලිස් සේවයට අදාළව එකී කාර්ය පටිපාටික රීති මගින් විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් වූ යම් රීති, නියෝග හෝ කාර්ය පටිපාටි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පනවනු ලබනතුරු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ක්‍රියාත්මක වීමේ දිනට බලාත්මකව පැවතියාවූ පොලිස් සේවය හා සම්බන්ධ අනෙකුත් සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී කොමිෂන් සභාව විසින් පනවනු ලැබ හෝ විධිවිධාන සලසනු ලැබ ඇති රීති, නියෝග හා කාර්ය පටිපාටි, ලෙස සලකා නොකඩවා බලාත්මක විය යුතු අතර ඒවා පොලිස් සේවය සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නැති පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් එකී කොමිෂන් සභාව විසින් සෘජුවම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

4. මෙම බලතල පැවරීම 2015 නොවැම්බර් මස 04 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි

මහාචාර්ය එස්. ටී. හෙට්ටිගේ,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2016 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ 07,
9 වන ගොඩනැගිල්ල,
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරි වර්ගීකරණයන්* | *II තීරුව*<br>*පවරනු ලබන බලතල* | *III තීරුව*<br>*බලතල පවරන ලද නිලධරයන්* |
|---|---|---|
| ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථානයන්හි ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව තනතුරුවලට පත්කිරීම සහ උසස් කිරීම.<br>ii. පරිවාස කාලය තුළදී පත්වීම අවලංගු කිරීම හෝ සේවය නතර කිරීම.<br>iii. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ස්ථාන මාරු කිරීමේ පටිපාටියට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>iv. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම.<br>v. වැඩ තහනම් කිරීම.<br>vi. තනතුර අතහැර යාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | පොලිස්පතිවරයා |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ භාර නිලධරයන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පටිපාටියට අනුව ස්ථාන මාරු කිරීම.<br>ii. විනය පාලනය.<br>iii. වැඩ තහනම් කිරීම.<br>iv. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | පොලිස්පතිවරයා<br>අදාළ පරිපාලන බල ප්‍රදේශ භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් | i. පරිවාස හා වැඩ බැලීමේ කාලසීමාවට පසු පත්වීම ස්ථිර කිරීම.<br>ii. සේවයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම. | පොලිස්පතිවරයා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (පරිපාලන) |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I තීරුව*<br>*නිලධාරි වර්ගීකරණයන්* | *II තීරුව*<br>*පවරනු ලබන බලතල* | *III තීරුව*<br>*බලතල පවරන ලද නිලධරයන්* |
|---|---|---|
| ප්‍රධාන පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. යම් නිලධරයකුගේ ඊළඟ නිලයට, ශ්‍රේණියට හෝ තනතුරට උසස් කිරීමෙන් පසු, එක්වරකට වර්ෂය බැගින් අවම වශයෙන් වසර 03 ක අනිවාර්ය වැඩ බැලීමේ සේවා කාලය දීර්ඝ කිරීම.<br>ii. කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණකර ගැනීම සඳහා වරකට වර්ෂය බැගින් අවම වශයෙන් වසර 03 ක් පරිවාස කාලසීමාව දීර්ඝ කිරීම. | පොලිස්පතිවරයා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශය තුළ) |
| පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති පටිපාටීන්ට අනුකූලව ඒ ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පරිපාලන බල ප්‍රදේශය තුළ ස්ථාන මාරුකිරීම්. (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාස භාර නිලධරයන් හැර)<br>ii. සේවයෙන් පහකිරීම් හැර ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය පාලන කටයුතු.<br>iii. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සලකා බැලීම (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාස භාර නිලධරයන් හැර) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පරිපාලන බලප්‍රදේශය යටතට ගැනෙන ස්ථාන මාරුකිරීම් (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ භාර නිලධරයන් හැර) | නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය) ؛ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි II වන ශ්‍රේණිය) වරුන්ගේ ඒ ඒ පරිපාලන බලප්‍රදේශය යටතට ඇතුළත් ස්ථාන මාරුකිරීම් (පොලිස් ස්ථාන භාර සහ ක්‍රියාකාරී කොට්ඨාශ භාර නිලධරයන් හැර) | දිසා භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාස භාර අධ්‍යක්ෂවරුන් වන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (පොලිස් අධිකාරී I ශ්‍රේණිය) , පොලිස් අධිකාරී (පොලිස් අධිකාරී II ශ්‍රේණිය) |
| පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ඒ ඒ පරිපාලන බලප්‍රදේශයන් තුළ වැඩ තහනම් කිරීම්<br>ii. අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ විනයශාලා දඬුවම් නියම කිරීම (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ භාර නිලධරයන් හැර) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති<br>නියෝජ්‍ය පොලිස්පති<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br>(පොලිස් අධිකාරී I ශ්‍රේණිය)<br>පොලිස් අධිකාරී<br>(පොලිස් අධිකාරී II ශ්‍රේණිය)<br>සහකාර පොලිස් අධිකාරී |

05 - 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.